සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

තෙවන වාර පරීක්ෂණය
மூன்றாம் கால சோதனை - 2026
Third Term Test

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade 13 | විෂයය / பாடம் / Subject කෘෂි විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper II | පැය / மணித்தியாலம் / Hours 03 |

**A කොටස - ව්‍යුහගත රචනා**

**සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.**

(එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය 100 කි.)

**1.** (A) (i) 2026 වර්ෂය ආරම්භයත් සමග ඇති වූ ගෝලීය අර්බුදය නිසා බොහෝ රටවල ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ ගැටලුකාරී තත්ත්ව උද්ගත වී තිබේ.මෙම ගැටලුවට මුහුණ දීම සඳහා ශ්‍රී ලංකා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

(ii) පහත දැක්වෙන බෝගවල ප්‍රධාන පර්යේෂණ ආයතනය පිහිටා ඇති ස්ථානය සඳහන් කරන්න.

(1) තල්..............................................................................................

(2) අර්තාපල්.......................................................................................

(B) පස් නියැදියක ක්ෂේත්‍ර ධාරිතාවය ගණනය කිරීම සඳහා සකස් කළ ඇටවුමක් පහත රූපසටහනෙන් දැක්වේ. ප්‍රශ්න අංක (i) සිට (iii) දක්වා පිළිතුරු සැපයීමට මෙම රූපසටහන යොදා ගන්න.




(i) ඉහත රූපසටහනේ A, B, C සහ D ලෙස ලේබල් කර ඇති කොටස් නම් කරන්න.

(1) A ............................................................

(2) B ............................................................

(3) C ............................................................

(4) D ............................................................

(ii) ක්ෂේත්‍ර ධාරිතාවය ගණනය කිරීමට පෙර මෙම ඇටවුම සකස් කර දින තුනක් පමණ විද්‍යාගාරය තුළ තැබිය යුතු ය. එයට හේතුව සඳහන් කරන්න.

..............................................................................................................

..............................................................................................................

(iii) මෙම පස් නියැදියේ තෙත් ස්කන්ධය ග්‍රෑම් 900 කි. එහි වියළි ස්කන්ධය ග්‍රෑම් 700 කි. හිස් සිලින්ඩරයේ ස්කන්ධය ග්‍රෑම් 200 ක් වේ නම් පස් නියැදියේ ක්ෂේත්‍ර ධාරිතාවය ගණනය කරන්න.

..............................................................................................................

..............................................................................................................

(C) බෝගයකට යොදන පොහොර ප්‍රමාණය සහ අස්වැන්න අතර සම්බන්ධතාවය නිරූපණය කරන ප්‍රස්තාරයක් පහත දැක්වේ. ප්‍රශ්න අංක (i) සිට (iv) දක්වා පිළිතුරු සැපයීමට මෙම ප්‍රස්තාරය භාවිත කරන්න.




(i) ප්‍රස්තාරයේ උපරිම අස්වැන්න නිරූපණය කර ඇති අක්ෂරය නම් කරන්න.

.......................................................................................................................

(ii) ප්‍රස්තාරයේ උපරිම ලාභය පෙන්නුම් කරන අක්ෂරය නම් කරන්න.

.......................................................................................................................

(iii) මෙම ප්‍රස්තාරයට අනුව යොදන පොහොර ප්‍රමාණය සහ උපරිම ලාභය අතර සම්බන්ධතාවය සඳහන් කරන්න.

.......................................................................................................................

(iv) පොහොර භාවිත කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා ගත හැකි උපායමාර්ග දෙකක් සඳහන් කරන්න.

(1) .......................................................................................................................

(2) .......................................................................................................................

(D) බෝගයට ලැබෙන ආලෝක තීව්‍රතාව අනුව බෝගවල ප්‍රභාසංස්ලේෂණ සීඝ්‍රතාවය විවිධ වේ. ප්‍රශ්න අංක (i) සහ (ii) සඳහා පිළිතුරු සැපයීමට පහත රූපසටහන භාවිත කරන්න.




(i) ඉහත A හා B මගින් නිරූපණය වන ශාක කාණ්ඩ දෙක සඳහන් කරන්න.

A - .......................................................................................

B - .......................................................................................

(ii) ඉහත (i) හි සඳහන් කළ ශාක කාණ්ඩ සඳහා බෝගය බැගින් සඳහන් කරන්න.

A - .......................................................................................

B - .......................................................................................

(E) බීජ ප්‍රරෝහණය සහ මනා බෝග වර්ධනයක් සඳහා නිවැරදි බිම් සැකසීමේ ක්‍රම හා බෝග සංස්ථාපන ක්‍රම අනුගමනය කිරීම ඉතා වැදගත් වේ.

(i) ප්‍රාථමික බිම් සැකසීමේ ප්‍රධාන අරමුණු දෙකක් සඳහන් කරන්න.

(1) ...............................................................................................................

(2) ...............................................................................................................

(ii) ශුන්‍ය බිම් සැකසීමෙන් ලැබෙන වාසි දෙකක් සඳහන් කරන්න.

(1) ...............................................................................................................

(2) ...............................................................................................................

(iii) ගොඩ බෝග සංස්ථාපනය සඳහා භාවිත කරන බීජ වප්කර දෙකක් සඳහන් කරන්න.

(1) ...............................................................................................................

(2) ...............................................................................................................

(F) අවශ්‍යතා සපුරා ගත හැකි ප්‍රමාණයෙන් ජලය වසර පුරාම හෝ වසරේ යම් කාලයක් තුළ ලබා ගත හැකි ජල මූලාශ්‍ර ජල ප්‍රභව ලෙස හැඳින්වේ.

(i) පිහිටීම අනුව ජල ප්‍රභව ආකාර දෙක සඳහන් කරන්න

(1) ...............................................................................................................

(2) ...............................................................................................................

(ii) කෘෂිකාර්මික කටයුතු සඳහා සුදුසු ජල ප්‍රභවයක් තේරීමේදී සලකා බැලිය යුතු ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(1) ...............................................................................................................

(2) ...............................................................................................................

(G) සුළු පරිමාණයෙන් බඩඉරිඟු වගා කර ඇති වියළි කලාපීය ප්‍රදේශයක පසේ දෘශ්‍ය ඝනත්වය 1.2 $gcm^{-3}$ ක් ද, මූල කලාපයේ ගැඹුර 50 cm ක් ද වේ. ක්ෂේත්‍ර ධාරිතා අවස්ථාවේ දී එම පසේ තෙතමන ප්‍රතිශතය 48% කි.

(i) ජල සම්පාදන අවස්ථාවේදී එම පසේ පාංශු තෙතමන ප්‍රතිශතය ගණනය කරන්න.

...............................................................................................................

...............................................................................................................

...............................................................................................................

(ii) බඩඉරිඟු බෝගයේ ශුද්ධ ජල සම්පාදන අවශ්‍යතාව ගණනය කරන්න.

...............................................................................................................

...............................................................................................................

...............................................................................................................

(iii) ඉහත ක්ෂේත්‍රය සඳහා වඩාත් සුදුසු ජල සම්පාදන ක්‍රමයක් නම් කරන්න.

...............................................................................................................

(iv) මෙම ක්ෂේත්‍රයේ වාෂ්පීකරණ උත්ස්වේදන වේගය දිනකට 7.2 cm ක් වේ නම්, වගා ක්ෂේත්‍රයට ජලය සැපයිය යුතු ජල සම්පාදන කාලාන්තරය ගණනය කරන්න.

...............................................................................................................

...............................................................................................................

...............................................................................................................

02. (A) ප්‍රශ්න අංක (i) සිට (iv) දක්වා පිළිතුරු සැපයීමට පහත රූපසටහන් භාවිත කරන්න.




(i) P හා Q ලෙස නම් කර ඇති බීජ ප්‍රරෝහණ ආකාර දෙක සඳහන් කරන්න.
 (1) P ..........................................................................................
 (2) Q ..........................................................................................

(ii) P හා Q බීජ ප්‍රරෝහණ ආකාර පෙන්නුම් කරන බෝගය බැගින් සඳහන් කරන්න.
 (1) P ..........................................................................................
 (2) Q ..........................................................................................

(iii) ඉහත බීජ ප්‍රරෝහණ ආකාර දෙක අතර නිරීක්ෂණය කළ හැකි ප්‍රධාන වෙනස්කමක් සඳහන් කරන්න.
 ..........................................................................................................................
 ..........................................................................................................................

(iv) රූපයේ දැක්වෙන A ව්‍යුහය තුළ සිදුවන, බීජ ප්‍රරෝහණය කෙරෙහි වැදගත්වන පරිවෘත්තීය ක්‍රියාවලිය සඳහන් කරන්න.
 ..........................................................................................................................

(B) බීජ නියැදියක තෙතමන ප්‍රතිශතය සෙවීමේ පරීක්ෂණයක නිරත වූ ශිෂ්‍යයෙක් ලබා ගත් දත්ත පහත දක්වා ඇත.

- බීජ නියැදියේ ආරම්භක ස්කන්ධය = 150 g
- නියත ස්කන්ධයක් ලැබෙන තුරු වියලූ බීජ නියැදිය සහිත කෝවේ ස්කන්ධය = 200 g
- හිස් කෝවේ ස්කන්ධය =80 g

(i) මෙම බීජ නියැදියේ තෙතමන ප්‍රතිශතය ගණනය කරන්න.
 ..........................................................................................................................
 ..........................................................................................................................
 ..........................................................................................................................

(ii) බීජ නියැදියේ තෙතමන ප්‍රතිශතය සෙවීම සඳහා ඉහත ක්‍රමය වෙනුවට යොදා ගත හැකි වෙනත් ක්‍රමයක් සඳහන් කරන්න.
 ..........................................................................................................................

(iii) බීජ සහතික කිරීමේ සේවය මගින් බිත්තර වීවල පහත එක් එක් ගුණාංගය සඳහා අනුමත කර ඇති පර්යේෂණාගාර ප්‍රමිතිය සඳහන් කරන්න.

| ගුණාංගය | පර්යේෂණාගාර ප්‍රමිතිය |
|---|---|
| (1) ප්‍රරෝහණ ප්‍රතිශතය | .............................................. |
| (2) තෙතමනය | .............................................. |
| (3) වල් බීජ | .............................................. |

(C) අස්වනු විභව්‍යතාවය ඉහළ නැංවීම සඳහා ගහනයක් තුළ ප්‍රවේණික විචලතාවක් ඇති කර හිතකර ප්‍රවේණිදර්ශ සහිත ජීවීන් තෝරා ගත යුතු වේ.

(i) ශාක තුළ ප්‍රවේණික විචලතාව ඇති කළ හැකි ක්‍රම දෙකක් නම් කරන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

(ii) විශාල ගහනයක් තුළින් අදාළ ලක්ෂණය සහිත වඩාත් ඔරොත්තු දෙන ශාක තෝරා ගැනීම සඳහා නුමුහුම් පෙළ වරණය යොදා ගැනේ.නුමුහුම් පෙළ වරණය සතු ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

(D) ශාකවල උත්ස්වේදන සීඝ්‍රතාවය මැනීමට යොදා ගන්නා පානමානයක රූප සටහනක් පහත දක්වා ඇත. ප්‍රශ්න අංක (i) සිට (iv) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට මෙම රූපසටහන යොදා ගන්න.




(i) මෙම ඇටවුම සකස් කිරීමේ දී පහත සඳහන් එක් එක් ක්‍රියාකාරකම් සිදු කිරීමට ප්‍රධාන හේතුව සඳහන් කරන්න.

(1) ජලය තුළදී අත්ත කපා ගැනීම.

..............................................................................................................

(2) ඇටවුම වායුරෝධක කිරීම.

..............................................................................................................

(ii) ඇටවුම සැකසීමේ දී ජල බඳුන පිරවීම සඳහා වර්ණක යෙදූ ජලය භාවිත කිරීමට හේතුව සඳහන් කරන්න.

..............................................................................................................

(iii) මිනිත්තු දහයකදී වායු බුබුල 5cm ක දුරක් ගමන් කළේ නම්, එම අවස්ථාවේ දී උත්ස්වේදන සීඝ්‍රතාවය ගණනය කරන්න.

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

(iv) යොදා ගත් අත්තේ පත්‍ර අර්ධයක් වන සේ කපා ඉවත් කළ විට උත්ස්වේදන සීඝ්‍රතාවයට කුමක් සිදු වේද?

..............................................................................................................

(E) ශාකයක සෛල විභාජනය සහ විශාල වීම නිසා ශාකයේ ප්‍රමාණයෙහි , පරිමාවෙහි හා බරෙහි අප්‍රත්‍යාවර්තී වැඩිවීම ශාක වර්ධනය ලෙස හැඳින්වේ.

(i) ශාක වර්ධනය මැනීමට භාවිත වන වර්ධන දර්ශක දෙකක් සඳහන් කරන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

(ii) ශාකයක, කාලය සමග වියළි බර වැඩිවන ආකාරය ප්‍රස්තාරයක් ඇසුරින් නිරූපණය කරන්න.

(F) පාලිත තත්ත්ව යටතේ බෝග වගා කිරීම පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ. මෙම ප්‍රකාශවල වැරදි / නිවැරදි බව සඳහන් කරන්න.

| | ප්‍රකාශය | වැරදි/ නිවැරදි බව |
|---|---|---|
| (i) | පරිසර තත්ත්ව පාලනය කිරීමේ දී වායව පාරිසරික සාධක පමණක් බෝගයට හිතකර ලෙස කෘතිමව පාලනය කිරීම සිදු කරයි. | ...................... |
| (ii) | පරපරාගනය වන ශාක පොලිතීන් උමං තුළ වගා කළ නොහැකි ය. | ...................... |
| (iii) | ආරක්ෂිත ගෘහයක් තුළ ප්‍රභා සංවේදී බෝග අවාරයේ වුව ද වගා කළ හැකි ය. | ...................... |
| (iv) | ලැත් නිවාස තුළ බෝග වගා කිරීම තුළින් කෘමි පළිබෝධ පාලනය සාර්ථක ව සිදු කල හැකිය. | ...................... |

(G) නූතන වාණිජ කෘෂිකර්මාන්තයේදී විවිධ නිර්පාංශු වගා ක්‍රම භාවිත කරයි.

(i) නිර්පාංශු වගාව සඳහා ඝන මාධ්‍යයක් තේරීමේ දී සලකා බලනු ලබන ගුණාංග දෙකක් සඳහන් කරන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

(ii) නිර්පාංශු වගාවේ පවතින සීමාකාරී තත්ව දෙකක් සඳහන් කරන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

03. (A) ආහාර නරක්වීම යනු යම් ආහාරයක් පරිභෝජනයට ගත නොහැකි තත්ත්වයට හෝ සෞඛ්‍යයට හානිකර විය හැකි තත්ත්වයට පත්වීමයි.

(i) ආහාර නරක් වීම කෙරෙහි "ජල සක්‍රීයතාව" බලපායි. ජල සක්‍රීයතාවය යනුවෙන් අදහස් වන්නේ කුමක්ද?

..............................................................................................................

..............................................................................................................

(ii) ආහාරයක ජල සක්‍රීයතාව අවම කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

(iii) ආහාර නරක් වීමට බලපාන රසායනික සාධක දෙකක් සඳහන් කරන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

(iv) ආහාර නරක්වීමේ අහිතකර බලපෑම් දෙකක් සඳහන් කරන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

(B) නවීන ආහාර පරිරක්ෂණ ක්‍රමයක් ලෙස ශීත වියළීම භාවිත කරයි.

(i) ශීත වියළීමේ මූලධර්මය සඳහන් කරන්න.

........................................................................................................

........................................................................................................

(ii) ශීත වියළීමේ භාවිතයන් දෙකක් සඳහන් කරන්න.

(1) ........................................................................................................

(2) ........................................................................................................

(C) ගව දෙනකගේ ඩිම්බකෝෂයක රූප සටහනක් පහත දැක්වේ . (i) සිට (iii) ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට මෙම රූපසටහන යොදා ගන්න.




(i) ඉහත රූපසටහනේ A සහ B ලෙස ලේබල් කර ඇති කොටස් නම්කර, එක් එක් කොටසේ ප්‍රධාන කාර්යය සඳහන් කරන්න.

| ඩිම්බකෝෂයේ කොටස | ප්‍රධාන කාර්යය |
|---|---|
| (1) A ........................................ | ................................................ |
| (2) B ........................................ | ................................................ |

(ii) (1) C අක්ෂරය මගින් නිරූපණය කර ඇති ක්‍රියාවලිය නම් කරන්න.

........................................................................................................

(2) C ක්‍රියාවලිය සිදුවන විට රුධිරගත FSH සහ LH සාන්ද්‍රණයට කුමක් සිදු වේ ද?

(a) FSH සාන්ද්‍රණය ..........................................................................

(b) LH සාන්ද්‍රණය ..........................................................................

(iii) කෘතිම සිංචන කිහිපයකට පසුව ද ගැබ් ගැනීමට අසමත් වූ ගව දෙනකගේ B ව්‍යුහයට කුමක් සිදු වේ ද?

........................................................................................................

(D) වාණිජ සත්ත්ව ගොවිපොළක සත්ව රෝග මනා ලෙස පාලනය තුළින් ගොවිපොළ ඵලදායිතාවය වැඩි කර ගත හැක.

(i) පහත දැක්වෙන රෝග ඇතිකරන රෝග කාරකයා බැගින් සඳහන් කරන්න.

| රෝගය | රෝග කාරකයා |
|---|---|
| (1) ගම්බෝරෝ රෝගය | ...................................................... |
| (2) පුල්ලෝරම් රෝගය | ...................................................... |
| (3) කුර හා මුඛ රෝගය | ...................................................... |
| (4) කිනිතුලු උණ රෝගය | ...................................................... |

(ii) වාණිජ සත්ව ගොවිපොළක භාවිත කළ හැකි ජෛව ආරක්ෂණ ක්‍රමවේද දෙකක් සඳහන් කරන්න.

(1) ........................................................................................................

(2) ........................................................................................................

(E) උසස් ලක්ෂණ සහිත පුං ගවයෙකුගෙන් ශිල්පීය ක්‍රම භාවිත කර ලබා ගත් ශුක්‍රාණු ඇගයීමෙන් පසු සකස් කර කෘතීම සිංචනය සඳහා භාවිත කරයි.

(i) ශුක්‍රාණු ඇගයීමේ දී භාවිත කරන එක් අන්වීක්ෂීය පරීක්ෂාවක් සහ දෘෂ්ටි පරීක්ෂාවක් සඳහන් කරන්න.

(1) අන්වීක්ෂීය පරීක්ෂාව - ..............................................................................

(2) දෘෂ්ටි පරීක්ෂාව - ..............................................................................

(ii) පහත දක්වා ඇති ශුක්‍රාණු සංරක්ෂණ ක්‍රම යොදා ගැනීමේ දී පවත්වා ගත යුතු උෂ්ණත්වය සඳහන් කරන්න.

(1) ශීත කිරීම - ....................................................................

(2) අධි ශීත කිරීම -.....................................................................

(iii) ගව දෙනුන් සිංචනය සඳහා බහුලව යොදා ගන්නා කෘතීම සිංචන ක්‍රමය සඳහන් කරන්න.

..........................................................................................

(F ) කෘෂිකර්මාන්තයේදී පරාගකාරකයන් (Pollinators) ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. කෘෂිකර්මාන්තයේ දී වැදගත්වන ජීවී හා අජීවී පරාගකාරකයන් සඳහා උදාහරණ දෙක බැගින් සඳහන් කරන්න.

(i) (1) ජීවී පරාගකාරක

(a) ..........................................................................................

(b) ..........................................................................................

(2) අජීවී පරාගකාරක

(a) ..........................................................................................

(b) ..........................................................................................

(ii) ජීවී පරාගකාරකයන් හිඟවීමට බලපාන හේතු දෙකක් සඳහන් කරන්න.

(1) ....................................................................................................................

(2) ....................................................................................................................

04. (A) බෝග ක්ෂේත්‍රවල පළිබෝධ කළමනාකරණය සඳහා විවිධ වර්ගයේ උපකරණ භාවිත කරනු ලබයි. ප්‍රශ්න අංක සහ ට පිළිතුරු සැපයීම සඳහා පහත රූප සටහන භාවිත කරන්න.

(i)




(i) ඉහත උපකරණය නම් කරන්න.

....................................................................................................................

(ii) රූප සටහනේ දක්වා ඇති උපකරණයේ P,Q සහ R ලෙස ලේබල් කර ඇති කොටස් නම් කරන්න.

(1) P ..........................................................................................

(2) Q..........................................................................................

(3) R ..........................................................................................

(B) එක් පරිසර පද්ධතියක සම්භවය වී, ඒ හා සමාන පරිසර පද්ධතියක් වෙත පැමිණ වර්ධනය වී, නව පරිසර පද්ධතියට හානි පමුණුවන ඕනෑම ශාකයක් ආගන්තුක ආක්‍රමණශීලී ශාකයක් ලෙස හඳුන්වයි.

(i) ආගන්තුක හා ආක්‍රමණශීලී වල් පැළෑටි ශ්‍රී ලංකාව තුළ ව්‍යාප්ත වීමට හේතු දෙකක් සඳහන් කරන්න.

(1) ..........................................................................................................

(2) ..........................................................................................................

(ii) ශ්‍රී ලංකාවේ සුලභව දක්නට ලැබෙන ආගන්තුක ආක්‍රමණශීලී ජලජ වල් පැළෑටි දෙකක් සඳහන් කරන්න.

(1) ..........................................................................................................

(2) ..........................................................................................................

(C) බෝගයක් අස්වනු නෙළීමට සුදුසු අවස්ථාවට පත්වී ඇති බව පෙන්නුම් කරන දර්ශක පරිණත දර්ශක ලෙස හඳුන්වයි.

(i) පහත සඳහන් පළතුරුවල පරිණත බව නිර්ණය කිරීම සඳහා යොදා ගත හැකි පරිණත දර්ශකය බැගින් සඳහන් කරන්න.

| බෝගය | පරිණත දර්ශකය |
|---|---|
| (1) අඹ | ............................................................ |
| (2) කෙසෙල් | ............................................................ |
| (3) වරකා | ............................................................ |

(ii) අස්වනු නෙළීමේදී පරිණත දර්ශක භාවිතයේ වැදගත්කම් දෙකක් සඳහන් කරන්න.

(1) ..........................................................................................................

(2) ..........................................................................................................

(D) කිරි ගව ගොවිපොළක කෙටිකාලීන පිරිවැය වක්‍ර පහත ප්‍රස්තාරයෙන් නිරූපණය කර ඇත. ප්‍රශ්න අංක (i) සිට (iii) දක්වා පිළිතුරු සැපයීම සඳහා එම ප්‍රස්තාරය භාවිත කරන්න.




(i) ප්‍රස්තාරයේ දැක්වෙන A, B, C සහ D පිරිවැය වක්‍ර නම් කරන්න.

A - ......................................................................

B - ......................................................................

C - ......................................................................

D - ......................................................................

(ii) ඉහත ප්‍රස්තාරයේ A, B හා C වක්‍ර U හැඩැති වීමට හේතුව සඳහන් කරන්න.

..........................................................................................................

(iii) මෙම නිෂ්පාදන ක්‍රියාවලියේ ප්‍රශස්ත පිරිවැය ලැබෙන අවස්ථාව සඳහන් කරන්න.

..........................................................................................................

(E) ශ්‍රී ලංකාවේ උඩරට කලාපයේ සුලභ ව හමුවන බෝග වගා පද්ධතියක රූපයක් පහත දක්වා ඇත. එම රූපය ඇසුරෙන් ප්‍රශ්න අංක (i) සහ (ii) ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) රූපයේ දැක්වෙන ගොවිතැන් ක්‍රමය නම් කරන්න.

.......................................................................................

(ii) මෙම ගොවිතැන් ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(1) ........................................................................................................

(2) ........................................................................................................

(iii) මෙම ගොවිතැන් ක්‍රමයෙන් ලැබෙන පාරිසරික ප්‍රතිලාභ දෙකක් සඳහන් කරන්න.

(1) ........................................................................................................

(2) ........................................................................................................

(F) කෘෂිකර්මාන්තය ආශ්‍රිත කටයුතුවලදී සතුන්ගෙන් මිනිසාට විවිධ සංක්‍රමණික රෝග වැළඳේ.

(i) කුඹුරු ආශ්‍රිතව කටයුතුවල නියැළෙන පුද්ගලයන්ට වැළඳිය හැකි සංක්‍රමණික රෝගයක් නම් කරන්න.

........................................................................................................

(ii) ඉහත (i) සඳහන් කළ රෝගය ඇතිකරන රෝගකාරකයා සඳහන් කරන්න.

........................................................................................................

(iii) එම රෝගය ආසාදනය වීම වැළක්වීමට ගත හැකි ක්‍රියාමාර්ගයක් සඳහන් කරන්න.

(1) ........................................................................................................

(2) ........................................................................................................

## B කොටස - රචනා

❀ ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

❀ අවශ්‍ය තැන්හි දී නම් කරන ලද පැහැදිලි රූපසටහන් දෙන්න.

(එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය 150 කි.)

5. (i) සමෝධානිත පළිබෝධ කළමනාකරණයේ වාසි විස්තර කරන්න.
   (ii) බෝග වගාවේ දී දුර්වල ජලවහනය නිසා බෝගවලට ඇතිවන අහිතකර බලපෑම් විස්තර කරන්න.
   (iii) ආහාරයක තත්ත්වය පාලනය කිරීමේ දී ආහාර ප්‍රමිතිවල වැදගත්කම විස්තර කරන්න.

6. (i) පාලිත පරිසරයක් තුළ බෝග වගාවේ දී පරිසර තත්ත්ව කළමනාකරණය කරන අයුරු විස්තර කරන්න.
   (ii) කෘෂි භාණ්ඩ අලෙවියේ දී අගය දාමය හා සැපයුම් දාමය අතර වෙනස පැහැදිලි කර අගය දාම විශ්ලේෂණයේ වැදගත්කම විස්තර කරන්න.
   (iii) කෘෂිකාර්මික වගා භූමියක ඇතිවන පාංශු ඛාදනය, පසේ නිෂ්පාදකතාවය කෙරෙහි ඇතිකරන බලපෑම විස්තර කරන්න.

7. (i) ශ්‍රී ලංකාවේ එළවලු වෙළෙඳපොළෙහි ලක්ෂණ විස්තර කරන්න.
   (ii) බෝග නිෂ්පාදකතාවය වැඩි දියුණු කර ගැනීම සඳහා ශාක වර්ධකයාමක භාවිත කළ හැකි ආකාරය සුදුසු උදාහරණ සහිතව විස්තර කරන්න.
   (iii) ශ්‍රී ලංකාවේ සත්ත්ව පාලනය පිළිබඳව පවතින කෘෂිකාර්මික විභවය විස්තර කරන්න.

8. (i) එළදෙනකගේ කිරි එරීමේ යාන්ත්‍රනය ගැලීම් සටහනක් ඇසුරින් විස්තර කරන්න.
   (ii) සහතික කළ බීජ නිෂ්පාදන වැඩ පිළිවෙළ මඟින් අත්වන ප්‍රතිලාභ විස්තර කරන්න.
   (iii) රසායනික පොහොර භාවිතයේ ඇති වාසි සහ අවාසි විස්තර කරන්න.

9. (i) සත්ත්ව සෞඛ්‍යය කළමනාකරණයේ වැදගත්කම විස්තර කරන්න.
   (ii) ජාන සම්පත් සංරක්ෂණ ක්‍රම විස්තර කරන්න.
   (iii) බිම් සැකසීමෙන් පසු පසක සිදුවන වෙනස්කම් විස්තර කරන්න.

10. (i) කෘෂි කාලගුණ මධ්‍යස්ථානයක ඇති කාලගුණ උපකරණ ස්ථාපනය කිරීම හා නඩත්තු කිරීම විස්තර කරන්න.
    (ii) පසු අස්වනු හානිය කෙරෙහි පාරිසරික හා කායික විද්‍යාත්මක සාධකවල බලපෑම විස්තර කරන්න.
    (iii) මිශ්‍ර බෝග වගාවේ වාසි සහ අවාසි විස්තර කරන්න.